අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව / எனது இல. / My Ref. | ED/04/59/08/01/01 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2025.06. 18 |

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම කලාප අධ්‍යක්ෂවරුන්,

සියලුම පියාධිපතිවරුන්,

සියලුම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,

සියලුම ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්,

**<u>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2025</u>**

2025 වර්ෂයට නියමිත වාර්ෂික ස්ථාන මාරුවීම් 2025 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කර ඇති අතර, මෙයට අදාළව ස්ථාන මාරු ලැබූ නිලධරයන් දැනුවත් කර ඔවුන්ට නව සේවා ස්ථානවල නියමිත දින වැඩ භාර ගැනීමට හැකි වන පරිදි එම නිලධරයින් ඔබගේ ආයතනයේ නිදහස් කරලීමට හා ඔවුන් වෙනුවට පැමිණෙන නිලධරයින් වෙත නව සේවා ස්ථානවල වැඩ භාර ගැනීමට හැකිවන ලෙස කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

02. මෙම ස්ථාන මාරුකිරීම සිදු කර ඇත්තේ 2024.08.20 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 27/2024 හි සඳහන් වාර්ෂික ස්ථාන මාරු පරිපාටියට අනුකූල වන අතර, තම මාරු ඉල්ලීම් පිළිබඳ වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුවේ අවධානය යොමු වී නැත්නම් පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති XVIII හි පරිච්ඡේදයේ 256 වගන්තියේ විධිවිධානවලට අනුකූලව අදාළ නිලධරයින්ට අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

03. අභියාචනා ඉල්ලුම්පත්‍රයෙහි ආදර්ශයක් මේ සමඟ අමුණා ඇති අතර ආකෘති පත්‍රය අනුව සකස් කරගත් අභියාචනා ඉල්ලුම්පත් 2025 ජුනි 25 වන දිනට ප්‍රථම මා වෙත එවන මෙන් කාරුණිකව දන්වමි. එම අභියචනා ඉල්ලුම්පතෙහි ස්කෑන් පිටපතක් ( Scan Copy) sltesrecruitemant@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතු අතර, 2025 ජුනි 25 දිනට පසුව ලැබෙන අභියාචනා සලකා නොබලන බවටද අදාළ නිලධරයන්ට දැන්විය යුතුවේ.

එස්.ඩබ්. චිත්‍රා රෝහිණී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ගුරු අධ්‍යාපනඥ)

අත්. කළේ - නාලක කලුවැව
ලේකම්